**ශීර්ෂය 173 - රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

**විගණන විෂය පථය**

---

රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 27 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණය

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.223,680,000 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.178,288,073 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.45,391,927 ක් හෙවත් සියයට 20 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2013 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 121,880,000 | 114,656,409 | 7,223,591 | 06 |
| මූලධන | 101,800,000 | 63,631,664 | 38,168,336 | 37 |
| එකතුව | 223,680,000 | 178,288,073 | 45,391,927 | 20 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** වැය විෂයයන් 03 ක් සඳහා සළසා තිබුණු රු.2,250,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

**(ii)** වැය විෂයයන් 12 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 24 සිට සියයට 91 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 17301 | 2,555,000 | 2,553,459 | 1,000,000 | 1,447,137 | 8,500,000 | 6,205,164 |

විෂය අංක 17301 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.6,205,164 ක් විය.

**(ඇ) අග්‍රිම ගිණුම්**

අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.4,160,416 ක් විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 371 හි සඳහන් විධිවිධානයන්ට පටහැනිව මාණ්ඩලික නොවන නිලධාරීන් 08 දෙනෙකුට අවස්ථා 24 කදී එකතුව රු.230,695 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්ය නිමකල වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, කාර්ය නිමවී මාස 01 සිට මාස 10 දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසුව අතුරු අග්‍රිම නිරවුල් කර තිබුණි.

(iii) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව එක් මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් වරකදී නිකුත් කළ හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු.20,000 ක් වී තිබුණත්, එම රෙගුලාසිවලට පටහැනි අවස්ථා 19 කදී නිලධාරීන් 12 ක් වෙත රු.20,000 ක් ඉක්මවූ එකතුව රු.677,150 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

**(ඈ) පොදු තැන්පත් ගිණුම්**

-----------------------

අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂ එකතුව රු.693,107 ක් විය. ඉන් වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.446,136 ක්වූ තැන්පතු 7 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**1.4 වත්කම් කළමනාකරණය**

--------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

--------------------------------------

අමාත්‍යාංශය පවත්වා ගෙන යනු ලබන සෙත්සිරිපාය II අදියර 6 වන මහලේ වූ බිම් ප්‍රමාණයෙන් ¼ ක කොටසක් හෙවත් වර්ග අඩි 5,450 ක ඉඩ ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂය ආරම්භයේ සිට 2014 නොවැම්බර් 01 දින දක්වා මාස 23 ක කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2014 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, අමාත්‍යාංශය විසින් 2014 මැයි 02 දින එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා ගබඩාවේ පැවති තොග පිළිබඳ සමීක්ෂණයක් සිදුකර සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

**--------------------------**

අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.859,371 ක් වූ අතර, එය වර්ෂයකට වඩා අඩු කාලය සිට පැවැත එන ශේෂ විය.

**1.5 අනුකූල නොවීම්**

**--------------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**-----------------------------------------------------**

2010 මැයි 14 දිනැති අංක CA/1/17/1 දරන ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතනයන්හි කාර්යාල හැකිතාක් දුරට රජයේ හෝ සංස්ථාවලට අයත් ගොඩනැඟිලිවල පවත්වා ගත යුතු වූවත්, ඊට අනුකූල නොවී අමාත්‍යාංශය විසින් නුවරඑළිය ව්‍යාපෘති කාර්යාලය වෙනුවෙන් ගොඩනැගිල්ලක් රු.676,500 කට බාහිර ආයතනයකින් ලබා ගෙන තිබුණි.

**1.6 කාර්යසාධනය**

**----------------**

2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

**------------------------------------------------**

කළමනාකරණ ප්‍රතිසංස්කරණ තුළින් රාජ්‍ය ආයතනයන්හි කාර්යසාධනය ඉහල නැංවීම පිණිස වන සිව් වාර්ෂික කාර්ය රාමුවක් සකස් කිරීම සඳහා බාහිර උපදේශන ආයතනයක් වෙත රු.1,944,000 ක වැඩපූර්ව අත්තිකාරම් ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන වන විටත් එම කාර්ය ඉටු කර නොතිබුණි.

**(ආ) සැලැසුම් කිරීම**

**-----------------**

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු නොකිරීම**

**--------------------------------------------------------------**

රාජ්‍ය කළමනාකරණ අමාත්‍යාංශය තුළ කාර්යාල පද්ධතිය සවිමත් කිරීම සහ ෂෙයාර් පොයින්ට් මෘදුකාංගය භාවිතයට ගැනීමෙන් විසඳුම් සෙවීමේ ව්‍යාපෘතිය සඳහා වාර්ෂික අයවැය ලේඛනයෙන් රු.1,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, එම සීමාව රු.3,340,564 කින් ඉක්මවා රු.4,340,564 ක් වැය කර තිබුණි.

**1.8 අනාර්ථික ගනුදෙනු**

---------------------

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 10 දින සිට මාර්තු 31 දින දක්වා කාලය සඳහා බත්තරමුල්ල සෙත්සිරිපාය II අදියර 06 වන මහල වෙනුවෙන් රු.11,746,636 ක් ගොඩනැඟිලි කුලී වශයෙන් ගෙවා තිබූ අතර එම කාලය තුළ අමාත්‍යාංශ කාර්යාලය වෙනත් පෞද්ගලික ගොඩනැඟිල්ලක පවත්වා තිබුණි.

**1.9 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

-------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 10 | 4 |
| (ii) | තෘතියික මට්ටම | - | - | - |
| (iii) | ද්විතියික මට්ටම | 100 | 41 | 59 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 24 | 16 | 8 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 04 | 04 | - |
| | එකතුව | 142 | 71 | 71 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 71 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.